# සැමට දත්ත: දැනුවත් කිරීම තුළින් දත්ත ප්‍රචලිත කිරීම
# දෘශ්‍යාබාධ සහිත තැනැත්තන්ගේ සංඛ්‍යාන සාක්ෂරතාවය ඉහළ නැංවීම

ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය

ආබාධ සහිත තැනැත්තන්ගේ ජාත්‍යන්තර දිනය, 2021, වෙනුවෙන් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රථම වරට දෘශ්‍යාබාධ සහිත තැනැත්තන්ගේ සංඛ්‍යාන සාක්ෂරතාව ඉහළ නැංවීම උදෙසා "ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ කාර්යයන්" යන මැයෙන් බ්‍රේල් ප්‍රකාශනයක් හා විශාලනය කරන ලද අක්ෂර යෙදූ ප්‍රකාශනයක් එළි දක්වන ලදි. මෙම ග්‍රන්ථයන්හි ජාතික සංගණන, නියැදි සමීක්ෂණ හා ඒවා පවත්වනු ලබන ආකාරය මෙන්ම විවිධ සමාජ ආර්ථික දර්ශක පිළිබඳව වටිනා තොරතුරු රැසක් අන්තර්ගත වේ. ශ්‍රී ලංකාවේ විශාලතම මෙන්ම ජාතික සංඛ්‍යාන පද්ධතිය තුළ ප්‍රධානම ආයතනය වන ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් රැස් කර, ගණනය කර, නිකුත් කරනු ලබන දත්ත හා සංඛ්‍යාතීන්හි සරල සංක්ෂිප්තයක් මෙහි අඩංගු වේ. එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලේ සහය ඇතිව දෙපාර්තමේන්තුව විසින් මෙම ප්‍රකාශන එළිදැක්වීම පසුගිය දෙසැම්බර් මස 03 වැනි දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී සිදු කරන ලදි.

සිංහල, දමිළ හා ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම  මුද්‍රණය කරන ලද බ්‍රේල් ප්‍රකාශනය හා විශාලනය කරන ලද අක්ෂර යෙදූ ප්‍රකාශනයට අමතරව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව හා එහි කාර්යයන් පිළිබඳව සංවාදාත්මක වාර්තාකරණයක් ඇතුළත් පොඩ්කාස්ට් වැඩසටහනක්ද මෙදින හඳුන්වාදෙන ලදි. මෙම වැඩසටහන යටතේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ හඬ පට 2021 දෙසැම්බර් මාසයේ සිට සතිපතා දෙපාර්තමේන්තුවේ ෆේස්බුක් හා ඉන්ස්ටග්‍රෑම් ගිණුම් ඔස්සේ ප්‍රචාරය කෙරෙනු ඇත. සමාජයේ සියළු ප්‍රජාවන්ගේ සංඛ්‍යාන සාක්ෂරතාවය වැඩිදියුණු කිරීම උදෙසා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගන්නා ලද මෙම පියවර 2020 වසරේ සිට එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලේද සහය ඇතිව දෙපාර්තමේන්තුව විසින් දියත් කරන ලද සන්නිවේදන උපායමාර්ගයේ එක් අංගයකි.

මේ පිළිබඳව අදහස් දක්වමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් පී.එම්.පී. අනුර කුමාර මහතා, රටක තිරසාර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීමේදී ආබාධ සහිත තැනැත්තන්ද ඇතුළුව සමාජයේ සියළුම ප්‍රජාවන්ට ප්‍රතිලාභ ලැබෙන ආකාරයේ ප්‍රතිපත්ති සම්පාදනය කර ක්‍රියාත්මක කිරීමට නම් කාලීන වූ, නිවැරදි වූ දත්ත අත්‍යවශ්‍ය බවත්, ඒ අනුව නිල සංඛ්‍යාතීන් සකස් කර ප්‍රකාශයට පත්කිරීමට අමතරව රටේ සියළුම ප්‍රජාවන්ගේ සංඛ්‍යාන සාක්ෂරතාවය ඉහළ නැංවීමේ වගකීම ඉටුකිරීමට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව නිරතුරුවම කැපවෙන බවත් අවධාරණය කරන ලදි.

එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලේ කාර්යභාරී නිලධාරිනී මෙන්ම කාන්තාවන්ගේ අයිතිවාසිකම් හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව ජාතික වැඩසටහනෙහි ප්‍රතිපත්ති විශ්ලේෂක, ශාලිකා කුරේ මහත්මිය ද මේ අවස්ථාවේදී අදහස් දක්වමින්, සමාජය අර්බුදයකට ලක්ව ඇති මෙවන් අවස්ථාවකදී පවත්නා සම්පත්වල හිඟ බව වැඩි වන විට හා ආයතනික හැකියාවන් සීමා වන විට සමාජයේ අවදානමට ලක් වී ඇති පිරිස් කෙරෙහි ඇති වන විසමානුපාතික බලපෑම් උග්‍ර වන බවත්, දැනුවත්ව තීරණ ගැනීම සඳහා ආබාධ සහිත තැනැත්තන් සවි බල ගැන්වීම උදෙසා ගත යුතු පළමු වැදගත්ම පියවර ඔවුන්ට තොරතුරු ළඟා කරදීම බවත් පෙන්වා දෙන ලදි. එබැවින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගෙන ඇති මෙම පියවර කිසිදු පුද්ගලයෙකු මඟ නොහැරෙන බව තහවුරු කිරීම සඳහා ඉතා වැදගත් බවත් ඇය විසින් ප්‍රකාශ කරන ලදි.


පී.එම්. පී. අනුර කුමාර
ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
306/71, පොල්දූව පාර,
බත්තරමුල්ල

දුරකථන: 011-2147001
ෆැක්ස්   : Fax : 011-2147011
dgcensus@statistics.gov.lk




ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් පී.එම්.පී. අනුර කුමාර මහතා සභාව ඇමතූ අවස්ථාව

**දැක්ම**

"දේශීය සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා කාලීන තොරතුරු ලබා දීම තුලින් කලාපයේ පෙර ගමන්කරු බවට පත් වීම."

**මෙහෙවර**

"ගෝලීයකරණ පසුබිමක් තුල සමෘද්මත් ජාතියක් බවට පත්වීම සඳහා නව තාක්ෂණය, සේවක කැපවීම සහ උපායශීලී නායකත්වය තුලින් කාලීන වූත් නිවැරදි වූත් දත්ත ලබා දීම මගින් වඩාත් ඵලදායී ලෙස දේශයෙහි සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම."

**ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ,**
**සංඛ්‍යාන මන්දිරය**
**නො.306/71,**
**පොල්දූව පාර, බත්තරමුල්ල.**

info@statistics.gov.lk
+94 11 2147000
+94 11 2147011
statistics.gov.lk

**විශේෂ හා පර්යේෂණ අධ්‍යන අංශය මගින් ප්‍රකාශයට පත් කරන ලදි.**

**8 වන මහළ, ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**
datacomm.dcs@gmail.com
0112147473 0112147474